# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்ப கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/MF/SCBBU/5/1 | ඔබේ අංකය / உமது இல / Your No: ........................................ | දිනය / திகதி / Date: 2019.03.12 |

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහ සංගමයේ මහ සභාව පැවැත්වීම හා අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර ගැනීම.</u>**

2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 34 වගන්තිය ප්‍රකාරව මේ වන විට සමෘද්ධි ප්‍රජා මූල බැංකු මහ සංගමය පිහිටුවා ඇත.

ඒ අනුව එහි ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය 2017 වසරේ අගෝස්තු මස පත්කර ගත් අතර එම අධ්‍යක්ෂ මණ්යේ නිල කාලය 2019 මාර්තු 31දිනෙන් අවසන් වේ. 2017 වසරේ මාර්තු මස 07වන දින නිකුත් කල අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් නියෝග ප්‍රකාරව 2019 වසර සඳහා නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පලාත් 09 නියෝජනය කිරීමට සමෘද්ධි බැංකු සමිති සභාපති වරුන්ගෙන් තෝරාගත යුතුවේ.

ඒ අනුව මෙම අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු යොමු කිරීම සඳහා ප්‍රථමයෙන් ඔබ දිස්ත්‍රික්කයෙන් නියෝජිතයෙකු තෝරාගත යුතුව ඇත.ඔබ විසින් දිස්ත්‍රික්කයට අදාල සියළුම ප්‍රජාමූල බැංකු සමිතිවල **<u>විධායක කමිටුවේ සභාපතිවරයා</u>** (විධායක කමිටුවේ සභාපති පමණි) කැඳවා එම සභාපතිවරුන් අතරින් එක් අයෙකු ප්‍රජාමූල මහ සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කිරිම සඳහා තෝරාගත යුතුවේ. මෙම තෝරා ගැනිමේදි ස්වේච්ජාවෙන්, ඡන්දයෙන් පත්කර ගත හැකි අතර මෙම තොරා ගැනිමේ කටයුත්ත ඔබගේ පෞද්ගලික අධික්ෂණයෙන් කල යුතුය.

දිස්ත්‍රික්කය නියෝජනය කිරීම සඳහා තෝරා ගත් විධායක කමිටු සභාපතිවරයාගේ පහත සඳහන් විස්තර 2019 අප්‍රේල් 10දිනට පෙර අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මුල්‍ය) වෙත යොමු කල යුතුවේ.

| දිස්ත්‍රික්කයේ නම | නියෝජනය කරන බැංකු සමිතියේ නම | තෝරාගත් විධායක කමිටුවේ සභාපතිගේ නම | ලිපිනය | දුරකථන අංක |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

මෙම රැස්වීම සඳහා තේ පැන් සංග්‍රහයක් වෙනුවෙන් එක් අයෙකු සඳහා රු.150/-ක වියදමක් දැරිය හැකි අතර ඒ සඳහා වන ඇස්තමේන්තුවක් ක්ෂුද්‍ර මුල්‍ය අංශය වෙත යොමු කිරිමෙන් අදාල ප්‍රතිපාදන ලබා ගත හැක.

තවද මෙම රැස්වීමට සහභාගිවීම සඳහා සමෘද්ධි බැංකු සමිති විධායක කමිටුවේ සභාපතිවරයාට ගමන් වියදම් දීමනාවක් උපරිම රු.500/-කට යටත්ව අදාල බැංකු සමිතියෙන් ලබාදිය යුතුය. මේ පිළිබඳ වැඩිදුර කරුණු අවශ්‍යවේනම් දුරකථන අංක 011-3054528 හෝ 011 – 2887469 අමතා ලබාගත හැකි බවද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

බී.කේ.නිශාන්ත
අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මුල්‍ය)

අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මුල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |